පුවත් වාර්තාවක් හෝ ලිපියක් සඳහා නිරවද්‍ය තොරතුරු ලබාගැනීමට විශ්වසනීය මූලාශ්‍ර භාවිතා කිරීම, බහු මූලාශ්‍ර භාවිතා කිරීම වැනි භාවිතාවන් යෝග්‍ය වේ.

තොරතුරු වල විශ්වසනීයත්වය සම්බන්ධයෙන් කතා කිරීමේදී, සති අග අරුණ (10/17) පුවත්පතේ "මෙවර නොබෙල් සාම තෑග්ග ඇමරිකාවෙන් යැපෙන පඹයෝ දෙන්නෙකුට" යන සිරස්තලයෙන් යුතුව පළවූ විශේෂාංග ලිපිය අවධානයට ගැනීම වටී.

එම ලිපියේ එක් කොටසක අදහස මෙසේ සාරාංශගත කළ හැක.

2021 නොබෙල් සාම ත්‍යාගය පිරිනැමුණු පිලිපීනයේ මරියා රෙසා සහ රුසියාවේ දිමිත්‍රි මුරතොව් යන ජනමාධ්‍යවේදීන් දෙදෙනා "ඇමරිකාවෙන් යැපෙන පඹයන්" යැයි මෙම ලිපිය පවසයි.

එහිදී මරියා රෙසා හට එවැනි චෝදනාවක් නැගීමේ පදනම ලෙසින් ලිපිය තුළ සඳහන් වන්නේ, ඇය කර්තෘ වන Rappler web අඩවිය නඩත්තු කරන්නේ ඇමරිකානු CNN සහ ඊබේ නිර්මාතෘ පියේර් ඔමිඩියර්ගේ ඔමිඩියාර් නෙට්වර්ක් සමාගම වීමයි.

ඊට අමතරව "පිටරටවල හමුදා කුමන්ත්‍රණ සඳහා අරමුදල් සපයන ඇමරිකානු රාජ්‍ය ආයතනයක් වන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජාතික අරමුදල' සහ මාක් සකර්බර්ගේ ෆේස්බුක් සමාගම ද Rappler හි ආයෝජකයන් වේ යැයි ලිපියේ දක්වා ඇත.

1) CNN වෙබ් අඩවිය සහ තවත් පුවත් වාර්තාවන් සඳහන් කරන ආකාරයට, මරියා රෙසා ෆේස්බුක් වෙත චෝදනා එල්ල කොට සිටින්නේ, ඇයව පීඩාවට පත් කිරීමට රජය ෆේස්බුක් අවියක් ලෙසින් භාවිතා කළ බවත්, ෆේස්බුක් සමාජ මාධ්‍යය එය වැලැක්වීමට කිසිවක් නොකළ බවත් වේ. මේ අනුව, ඇගේ කතාවේ තවත් පැතිකඩක් තිබේ. එසේ නම්, පිළිගත් මාධ්‍ය වාර්තා තුළ සඳහන් වන එම සන්දර්භය සැලකිල්ලට නොගනිමින්, Rappler වෙබ් අඩවියට ෆේස්බුක් සමාගම ආයෝජනය කර ඇත යනුවෙන් සඳහන් කිරීමට පදනමක් සහ මූලාශ්‍රයක් තිබේද?

2) මරියා රෙසා සහ දිමිත්‍රි මුරතොව් හට නොබෙල් ත්‍යාගය පිරිනැමෙන්නේ ඔවුන් ප්‍රකාශනයේ නිදහස වෙනුවෙන් දැරූ ධෛර්ය සම්පන්න ප්‍රයත්නයන් නිසා යැයි සඳහන් වේ. එසේ නම්, එම කරුණ බිඳ හෙලීමට තාර්කික පදනමක් මෙම ලිපිය තුළින් ඉදිරිපත් වේද?

3) ඒ අනුව මෙම ලිපිය සම්බන්ධයෙන් පාඨක ඔබගේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.reutersagency.com/en/about/standards-values/...
https://edition.cnn.com/.../maria-ressa.../index.html
https://www.bloomberg.com/.../how-rodrigo-duterte-turned...
https://www.nobelprize.org/nobel-prize-lessons-peace-2021/

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna**